**ජාතික මෝස්තර මධ්‍යස්ථානය - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මධ්‍යස්ථානය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 | | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.9,557,494 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවරදි කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රදාන සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.11,075,033 ක ක්‍රමක්ෂය වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රු.3,323,435 ක අතිරික්තයක් මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය විය. තවද, ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත අරමුදලට ගැලපුම් කළ යුතු වුවත් ඊට පටහැනිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.109,431,667 ක් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවරදි කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව කටයුතු කළ යුතුවේ. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| වත්කම් වර්ග 04 ක පිරිවැය | 62,612,120 | 48,638,769 | 13,973,351 | මෙම වත්කම පන්තීන් වලට අදාළ ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම 2008 වසර සිට ආරම්භ කර ඇති අතර පැරණි වත්කම් එම වත්කම් ලේඛනවල ඇතුළත්ව නොතිබීම මීට හේතුවයි. ඉදිරියේදි ප්‍රත්‍යාගණනය කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | වෙනස්කම් හදුනාගෙන ශේෂ නිරවුල් කළ යුතුවේ. |
| නිමි තොග අපහරණ වටිනාකම | 156,274 | 6,635 | 149,639 | 2022 භාණ්ඩ සමීක්ෂණයට අනුව හඳුනා ගත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ, විකිණිය හැකි වුවද, එම භාණ්ඩවල පිරිවැයට වඩා අඩු අගයක් විකිණීමෙන් ලබාගත හැකි බැවින් ඒවා නිමි තොග වලින් අඩු කොට දක්වා ඇත. | තොග නිවරදිව ගිණුම් ගත කළ යුතුවේ. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා ඇති එකතු වටිනාකම රු.344,261 ක් වූ ශේෂ 09 ක් වර්ෂ 03 ක් ඉක්මවා ගිය ද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 344,261 ක් වන ශේෂ අතරින් රු.239,250 ක මුදල ලක්සල ආයතනයට අලෙවි කරන ලද සාම්පල් භාණ්ඩ වෙනුවෙන් අයවිය යුතු මුදල් වන අතර අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් කළද ගෙවීම් කිරීමේ ප්‍රමාදයක් පවතී. | ලැබිය යුතු ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය අනුව | කෙටුම්පත් වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත එනම් පෙබරවාරි 28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාද වී 2023 අප්‍රේල් 19 ඉදිරිපත් කර තිබුණි. | කාර්ය මණ්ඩල ඌණතාවය සහ භාණ්ඩ සමීක්ෂණය නිම කිරීමට කල්ගතවීම ප්‍රමාදයට බලපෑ අතර ඉදිරි වර්ෂවලදී මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,323,435 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,902,973 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,579,538 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් ආදායම්හි රු.7,790,237 ක වර්ධනයක් පෙන්නුම් කළද, පුනරාවර්තන වියදම් සහ සංවර්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන අඩු වීමට සාපේක්ෂව සංවර්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතනයේ වාර්ෂික සැලසුම් අනුව නව නිර්මාණ 500 ක් හඳුන්වා දීම ඉලක්කගත කර තිබුණද 2022 දෙසැම්බර් මාසයේ ලබාදුන් මූල්‍ය හා භෞතික ප්‍රගතිය අනුව ශිල්පීන්ට නව නිර්මාණ 189 ක් හඳුන්වා දී තිබුණි. එය සියයට 38 ක් වැනි පහළ ප්‍රතිශතයක් විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේදී වැඩසටහන් 35 ක් සඳහා නව නිර්මාණ ලබාදීමට සැලසුම් කළද, සැලැස්ම සංශෝධනය වීමෙන් වැඩසටහන් 18 ක් පමණක් කිරීමට සිදුවිය. ඒ අනුව වැඩසටහන් 35 කට ලබාදිය යුතු නිර්මාණ 18 කට පමණක් ලබාදීමත් රටේ තිබූ වතාවරණය අනුව, ශිල්පීන් පුහුණු වැඩසටහන් වලට පැමිණීම ධනාත්මක | ඇස්තමේන්තු ප්‍රකාරව ඉලක්ක ලඟා කර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | මට්ටමක නොතිබීමත් මෝස්තර අඩුවෙන් සැපයීමට එක් හේතුවකි. | |
| **(ආ)** | මධ්‍යස්ථානය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ලද රු.51,313,305 ක මුදලින් රු.36,507,029 ක් එනම් ව්‍යාපෘති මුදලෙන් සියයට 71 ක් 2015 සිට 2019 කාලපරිච්ඡේදය තුළ වැයකර තිබුණ ද එම මුදල් ශිල්පීන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඵලදායීව යොදාගෙන තිබේද යන්න පරීක්ෂා කිරීමට ව්‍යාපෘති වාර්තාවක් හෝ එක් එක් වැඩසටහනේ කාර්යසාධනය හා ප්‍රගතිය පරීක්ෂා කල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතියෙන් ලද මුදලින් රු.10,584,174 ක් එනම් මුළු ලැබීම් වලින් සියයට 20 ක් ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි කාර්යයන් වලට යොදාගෙන තිබුණි. | ව්‍යාපෘතියේ කාර්යයන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සෑහීමකට පත් වන අයුරින් සිදු කිරීමෙන් පසුව වැඩසටහන් වල පිරිමැසුම් ලෙස ආයතනයට ඉතිරි වූ මුදලින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ආයතනයේ කාර්යයන් කිහිපයකට යොදා ගෙන තිබිණි. ඉදිරියේදී සුපරීක්ෂණ වැඩසටහන ඉතිරිව ඇති මුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. | අරමුදල් අදාළ අරමුණ සඳහාම යෙදවීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2021 වර්ෂයේදී වටිනාකම රු.735,000 ක් වූ ලැප්ටොප් 03 ක් හා රු.42,000 ක් වටිනා Hard Disk 02 ක් තොරතුරු තාක්ෂණ ඒකකය පිහිටුවීම සඳහා මිලදී ගෙන තිබුණ ද, විගණිත දිනය දක්වා එම ඒකකය පිහිටුවා නොතිබුණි. | මේ සඳහා අනුයුක්ත කර සිටි නිලධාරීන් සේවයෙන් ඉවත් වීමෙන් පසු චක්‍රලේඛ ප්‍රකාරව නව නිලධාරීන් බඳවා ගැනීම තාවකාලිකව නවතාලීම හේතුවෙන් මෙම අංශය සඳහා මිලදී ගත් භාණ්ඩ දැනට ගබඩාව තුළ ඉතිරි වී ඇත. දැනට නව මිලදීගැනීම් සීමා කර ඇති බැවින් 2022 වසර තුළ ඇති වූ පරිගණක අවශ්‍යතා වෙනුවෙන් මෙම මිලදී ගත් පරිගණක 02 ක් ලබා දී ඇත. | තොරතුරු තාක්ෂණ ඒකකය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වේවැල් හා උණ ලී අංශය සඳහා 2021 වර්ෂයේ මිලදී ගත් රු.255,000 ක් වටිනා බැම්බූ ස්ටීමර් යන්ත්‍රයද, එකතු වටිනාකම රු.387,639 ක් වූ කැමරාවක්, ටැබ් 2 ක් , ලැප්ටොප් පරිගණක 2 ක් වර්ෂ දෙකක සිට, රු.148,200 ක් වටිනා ගෑස් පෝරණුවක් සහ ඉදිකිරීමේ පිරිවැය හඳුනා නොගත් දර පෝරණුව වසර 19 ක පමණ කාලයක සිට ද නිෂ්ක්‍රියව පැවතුණි. | කුඩා හා මධ්‍ය පරිමාණ රාජ්‍ය අංශය හා ජාතික ශිල්ප සභාව එක්ව බැම්බු ස්ටීමර් යන්ත්‍රය ශිල්පීන් සඳහා භාවිතා කළ හැකි පරිදි ලියාපදිංචි සමිතියක් වෙත ලබා දීමට සාකච්ඡා කරමින් පවතී.<br>සේවයෙන් ඉවත් වූ නිලධාරීන් දෙදෙනෙකු භාවිතා කළ උපකරණ වන අතර නව බඳවා ගැනීමක් සිදු නොවූ බැවින් එම උපකරණ ගබඩාවට භාර දී ඇත.<br>අධ්‍යාපනය ලබන ළමුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මැටි භාණ්ඩ පෝරණු ප්‍රයෝජනවත් බැවින් එය සංරක්ෂණය කර පවත්වාගෙන යෑමට යෝජිතයි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |